# රාජ්‍ය ආයතනවලට නව පත්වීම් එපා

## මැතිවරණ නිරීක්ෂකයෝ රාජ්‍ය පරිපාලන ලේකම්ට ලියති

[දිනුක **මලින්ද හේරත්**]

ජනාධිපතිවරණයක් ප්‍රකාශයට පත්කර ඇති අවස්ථාවක රාජ්‍ය ආයතන සඳහා නිලධාරීන් පත් කිරීම නොකරන ලෙසත් රාජ්‍ය ආයතන සතු දේපළ, උපකරණ සහ මානව සම්පත් මැතිවරණ ක්‍රියාකාරකම් සඳහා යොදවා නොගන්නා ලෙසත් ඉල්ලා පැෆ්රල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා ඊයේ (25) රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාට ලිපියක් යොමු කර තිබේ.

එම ලිපියේ සඳහන් වන ආකාරයට රටක රාජ්‍ය නායකයා තෝරා ගැනීම සඳහා පවත්වනු ලබන ඡන්ද විමසීම අනෙකුත් මැතිවරණවලට සාපේක්ෂව සුවිශේෂීය. එබැවින් කිසිදු අපේක්ෂකයෙකුට අගතියක් හෝ සුවිශේෂ වාසියක් නොවන පරිදි කටයුතු කටයුතු කළ යුතුය. තවද මැතිවරණ කාලසීමාව තුළ නිලධාරීන් බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම, බඳවා ගැනීම්, උසස් වීම් හා ස්ථාන මාරු වීම් ලබාදීම නොකළ යුතු බවට මැතිවරණ කොමිසමේ සභාපතිවරයා විසින් අවස්ථා ගණනාවකදීම චක්‍රලේඛ මගින් දැනුවත් කර ඇති බවද එහි සඳහන් වේ.